# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 16 දරන බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මාර්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 16 දරන බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 16/91

**බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයකු වන හෙයින් ද, ශ්‍රී ලංකාවට ඒ අරමුදලේ සාමාජිකයකු වීමට හැකි කරනු ලැබූ බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සම්මත කිරීමට පෙරාතුව ඒ අරමුදලේ මුල් ගිවිසුම් කොන්දේසි පාඨය පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබනු ලැබූ හෙයින් ද: පූර්විකාව.

අරමුදලේ පාලක මණ්ඩලය විසින් 1990 ජූනි මස 20 වන දින පවත්වන ලද ඒ පාලක මණ්ඩලයේ රැස්වීමක දී ඒ ගිවිසුම් කොන්දේසිවල XXVIII වන ව්‍යවස්ථාව අනුව කටයුතු කරමින් සම්මත කරන ලද යෝජනා සම්මතයක් මගින්, (මේ පූර්විකාවෙහි "යෝජිත සංශෝධනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගිවිසුමේ ඒ ව්‍යවස්ථාවලට කරන ලද තුන්වන සංශෝධනය සම්මත කරන ලද හෙයින් ද:

යෝජිත සංශෝධනයේ පාඨය 1991 ඔක්තෝබර් මස 11 වන දින පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබන ලද හෙයින් ද:

යෝජිත සංශෝධනය ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පිළිගනු ලැබ ඇති හෙයින් ද:

ඒ තීරණයට පූර්ණ බලය දීම සහ බලගැන්වීම පිණිස බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සංශෝධනය කිරීම අවශ්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 16 දරන බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් වූ ගිවිසුම් කොන්දේසිවලට කරන ලද තුන්වන සංශෝධනය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන දිනය වශයෙන් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

2. බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනතේ 10 වන වගන්තියේ "අරමුදල් ගිවිසුම" යන්නෙහි අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 424 වන අධිකාරයේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

"'අරමුදල් ගිවිසුම' යන්නෙන්—

(අ) විශේෂ ගැණුම් හිමිකම් පදනම් කර ගනු ලැබූ පහසුවක් ඇති කරලීම පිණිස (එකී සංශෝධනයේ පාඨය 1968 නොවැම්බර් මස 23 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි තබන ලදී) ; සහ

2 ඩී 020778—5,730 (91/11)

(ආ) නව ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමයක් සංස්ථාපනය කිරීම පිණිස (එකී සංශෝධනය 1978 අප්‍රේල් මස 4 වන දින ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ අරමුදලේ ගිවිසුම් කොන්දේසිවල පාඨයෙහි ඇතුළත් කරන ලදී.) ; සහ

(ඇ) ඒ ව්‍යවස්ථා යටතේ වූ ස්වකීය බැඳීම් ඉටු නොකරන සාමාජික රටක ඡන්දය දීමේ හා ඊට සම්බන්ධ අයිතිවාසිකම් අත්හිටුවීම සඳහා විධිවිධාන සැලසීම පිණිස (එකී සංශෝධනයේ පාඨය 1991 ඔක්තෝබර් මස 11 වන දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.)

මුලින් සම්මත කොට ඉන් අනතුරුව සංශෝධනය කරන ලද පරිදි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම් කොන්දේසි අදහස් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාලයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.